ශීර්ෂය 119 - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 119 - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ බලශක්ති අංශයට අදාලව වාර්ෂික ආදායම් රැස්කිරීම 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාලව පිළිවෙලින් රු.මිලියන 113.59 ක්, රු.මිලියන 225.27ක් හා රු.මිලියන 187.22 ක් වූ අතර ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ සියයට 98 කින් වර්ධනය වී තිබූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 17 කින් අඩු වී තිබුණි. | 2022 වර්ෂයේ දී රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මත ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ලියාපදිංචි ආයතන විසින් ව්‍යාපාරික කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුනොකිරීම ආදායම් අඩුවීමට හේතුවී ඇත. | ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීතිරීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. මිලියන | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 1645(අ) , (ඇ) සහ 1646 | - | සියළුම සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් සෑම මසක් අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2022 වර්ෂයට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් නියමිත පරිදි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන්පත්‍ර හා මාසික සාරාංශ සටහන්පත්‍ර නියමිත පරිදි රජයේ විගණන අංශය වෙත යොමුකිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය | - | චක්‍රලේඛයේ II වැනි උපලේඛනයේ I(අ) හා I(ආ) යටතේ ඇතුලත් නොවන, සියළුම ආදායම් ගණන්දීමේ නිලධාරීන් තම අර්ධ වාර්ෂික ආදායම් වාර්තා නියමිත කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුලත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද අදාල වාර්තා නියමිත කාල සීමාවන් තුල ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව සකස් කළ අර්ධ වාර්ෂික ආදායම් වාර්තාව 2022.09.14 දින අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 දරන අයවැය චක්‍රලේඛය | 5.50 | අහෝසි වී ගිය රාජ්‍ය අමාත්‍යාංශය සතු ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන නිල බැංකු ගිණුම (7040530) 2023 අප්‍රේල් 30 දින වන විටත් වසා දමා නොතිබූ අතර 2023 පෙබරවාරි 28 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු.මිලියන 5.50 ක් වී තිබුණි. | නිවැරදි බැංකු ශේෂය හඳුනාගැනීම සඳහා සකස් කළ සංශෝධිත මුදල් පොතෙහි හා බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් පසුව අවශ්‍ය අතිරේක අක්මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන, රාජ්‍ය අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මෙහෙයුම් අත්පොතෙහි 6.8 ඡේදය | - | රාජ්‍ය ව්‍යවසායන්හි සම්පත් අමාත්‍යාංශ සහ වෙනත් ආයතන විසින් භාවිතා නොකළ යුතු වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ මෝටර් රථයක් අමාත්‍යාංශය විසින් පරිහරණය කරමින් පැවතුණි. | මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබා ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ජේදයේ විධිවිධාන වලට අනුකූල වීමකින් තොරව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට මාස 4 කට පමණ පසු එනම් 2022 අප්‍රේල් 08 දින අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | උක්ත චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 මඟින් දක්වා ඇති පරිදි ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන ඇස්තමේන්තුගත මුදල ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | අදාල මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයට අදාලව සකස් කර තිබූ ප්‍රසම්පාදන කාලසටහන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාරව නියමිත ආකෘති භාවිතා කර පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන කාල සටහන සකස් කර අනුමත කර ඇත. | -එම- |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමත්,ප්‍රසම්පාදන කාල සටහන සකස් කිරීමත් කල යුතු වුවද, පුනර්ජනනීය අංශය විසින් 2022 වර්ෂය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සම්පාදනය කර ඇත. | -එම- |

#### 3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉන්ධන සැපයුමේ ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීමට හා විශ්වාසනීයත්වය ඇති කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් | පසුගිය කාලය තුළ පැවති ආර්ථික අර්බුදයත් සමඟ ඊට අදාළ ව්‍යාපෘති මෙහෙයවීමේ කටයුතු බොහෝ දුරට අඩපණ විය. ඉදිරි වසර තුළ මෙම වැඩ පිළිවෙල | රට තුල ප්‍රශස්ථ ඉන්ධන සැපයුමක් තහවුරු කිරීම පිණිස විධිමත් වැඩපිළිවෙලක් |

| | | |
|---|---|---|
| තෙල් සමාගම (LIOC) යන ආයතන දෙකම ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය මගින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | තවදුරටත් ශක්තිමත් කර විධිමත් පරිදි ඉටු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | සකස් කළ යුතුය. |

### 3.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුතුරාජවෙල JET-A1 ගබඩා ටැංකි ඉදි කිරීම සහ මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල දක්වා JET A-1 හුවමාරු නල මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් මස අවසන් කිරීමට යෝජිතව පැවතියද, නියමිත කාලවකවානු තුල ආරම්භ කර නොතිබූ අතර රට තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල නිර්දේශය මත ප්‍රසම්පාදනය අවලංගු කර තිබූ හෙයින් එම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමා තිබුණි. | මේ සඳහා 2020 වර්ෂයේදී තරඟකාරී ලංසු කැඳවන ලදී. ලංසුකරු තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර රට තුල පැවති මූල්‍ය අර්බුදය හමුවේ ප්‍රසම්පාදනය අවලංගු කරන ලදී. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කල යුතුය. |

### 3.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති** | | |
| **(i)** පලාලි ගුවන්තොටුපල කලාපීය ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 575 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2019 ජුනි 06 දිනැති අංක 18/1229 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ව්‍යාපෘතිය 2020 දෙවන කාර්තුව අවසානයේ දී පර්යන්තය ඉදිකිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂාකර තිබුණි. එසේ වුවද. 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබූ මෙම ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය සියයට 4 ක් පමණ වී තිබූ අතර මේ සඳහා රු.මිලියන 9.8 ක මුදලක් වැයකර තිබුණි. | මේ වන විට අවශ්‍ය ඉන්ධන පිරවුම් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර මූලිකව ඉන්ධන සැපයීමේ කටයුතු පවත්වා ගෙනයාම සඳහා රු. මිලියන 9.8 ක පිරිවැයක් දරමින් පරිවර්තක ඒකකය (Convertainer) මිලදී ගන්නා ලදී.<br><br>තවදුරටත් ඉන්ධන සැපයීමේ ක්‍රියාවලිය පුළුල්ව සිදුකිරීමට අවශ්‍ය ඉඩම් වෙන්කරගත් වහාම ඉටු කළ යුතු සෙසු කාර්යයන් වියදම් කළමනාකරණය කර ගනිමින් අවම වියදමකින් ඉටුකිරීමට කටයුතු කරනු ඇත. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදුකිරීමත්,ගැටළුකාරී තත්වයන්හිදී අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදුකර ව්‍යාපෘති කඩිනමින් නිමකරවීම සඳහාත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ව්‍යාපෘති අංක 2036 - මාබිම මාර්ගය නැවත සකස් කිරීම සඳහා රු. මිලියන 705 ක් ඇස්තමේන්තු කර තිබූ අතර**,** ඊට අදාළ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි. | අලුතින් ඉඩම් කොටස් 2 ක් , අත්පත් කර ගැනීමට කටයුතු කළ හෙයින් මාර්ගයේ දිශානතිය යලිත් වෙනස් කිරීමට සිදුවී ඇත. දැනට මැනුම් කටයුතු සිදුකරමින් පවතී. | -එම- |
| (iii) | ව්‍යාපෘති අංක 2227 - SOREM ඉඩමේ ආරක්ෂක අවශ්‍යතා සඳහා ආරක්ෂක මුර කුළුණු, මායිම් බිත්ති, වැටවල් සහ පර්යන්ත මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ඊට අදාළ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භකර නොතිබුණි. | **SOREM** ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ ව්‍යාපෘතිය සහ මාබිම මාර්ගය නැවත සකස් කිරීම යන ව්‍යාපෘති අවසන් වූ පසු මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ හැකිය. | -එම- |
| (iv) | LBD මාගල්ලේ අංක 04 සහ 05 තෙල් ටැංකි සඳහා අභ්‍යන්තර වහල සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 35 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණද භෞතික ප්‍රගතිය සියයට 25 ක් පමණක් වී තිබුණි. | පසුගිය මාසයන් හී පැවති මිල උච්ඡාවචනයන් හේතුවෙන් **CIDA** අනුමත ක්‍රමයට මිල වැඩිවීම් ඉල්ලුම් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා තුරු අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීම් වල ප්‍රමාදය ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අඩු වීමට ද බලපා ඇත. | -එම- |
| (v) | කොළොන්නාව සිට කොළඹ වරායේ සේරම් ගේට්ටුව ( **Seram gate)** දක්වා දැනට පවතින අඟල් 10 නලමාර්ගය ප්‍රතිශ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 809.8 ක මුදලක් ඇස්තමේන්තුකර තිබූ අතර එහි වැඩ 2022 අප්‍රේල් ආරම්භ කර 2023 අප්‍රේල් වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුනද, ව්‍යාපෘතියේ වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල මාර්ග සමීක්ෂණය සිදු කිරීම සඳහා 2023 මැයි මස කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නියමිතය. | -එම- |
| (ආ) | පැවති රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් සිදු කිරීමට නියමිතව තිබූ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ගල මුදුන, උඩගල් දෙබොක්ක, මැදකැලේ යන ගම්මාන තුන සඳහා ජාතික ජාලයෙන් බැහැරව පුනර්ජනනීය බල ශක්තිය උපයෝගී කර ගනිමින් කුඩා | රටේ පැවැති උද්ධමනකාරී තත්වය මත ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තු වියදම රු. මිලියන **147** ක් විය. මෙම ව්‍යාපෘතියේ ඇති වැදගත්කම හේතුවෙන් මෙය තවදුරටත් කර ගෙන යාම සඳහා අමතර මුදලක් වැය වන්නේ නම් එය | රජයේ මුදල් නිෂ්කාර්යව පැවතීමට ඉඩනොදී උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ජාල මඟින් විදුලි පහසුකම් සැපයීම සඳහා රු. මිලියන 56.54 ක් 2021 දෙසැම්බර් 29 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවද, රු. මිලියන 33.36 ක් වැය කරමින් ගල මුදුන ගම්මානය සඳහා විදුලි පහසුකම් ලබා දී තිබුනද, උඩගල් දෙබොක්ක, මැදකැලේ යන ගම්මාන සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විදුලි පහසුකම් සපයා නොමැති අතර 2021 වර්ෂයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලබා ගත් ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 23.18 ක් නිෂ්කාර්යව පැවතුණි. තවද , නිම නොකරන ලද ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් දැරීමට අවශ්‍ය පියවර ගනු ඇත. |

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

#### 3.2.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙ. වො. 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබා ගැනීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන.19,288 ක් වූ මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කල ද අවුරුදු 4 කට ආසන්න ප්‍රමාද කාලයකින් පසුව මෙහි වැඩකටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි.මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් රු.මිලියන 28 කට ආසන්න මුදලක් (USD 177,931) දණ්ඩන ලෙස (commitment charges) ගෙවීමට සිදු වී තිබුණි.මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීම සඳහා මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ව්‍යාපෘතියේ ලොට් අංක 01 නැවත සැලසුම් කිරීමට සිදු වීමත්, ඒක දේශීය මත්ස්‍ය විශේෂයක් හමුවීම හේතුවෙන් ඒ පිළිබඳ අතිරේක පරිසර අධ්‍යයනයක් කිරීමට සිදු වීමත් දක්වා තිබුණි. 2022 දෙසැම්බර් 31 | ව්‍යාපෘතියේ මූලික කටයුතු 2018 මැයි මස ආරම්භ කරන ලද අතර වේල්ල සහ උමග ඇතුළු ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම් කටයුතු 2020 ජනවාරි 16 දින ආරම්භ කරන ලදී. මේ වන විට 57.2% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. | විදේශ ආධාර ඵලදායිව උපයෝජනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් නිසි අධීක්ෂණයකින් යුතුව ව්‍යාපෘති නියමිත කාලවකවානු තුල ක්‍රියාත්මක කරවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9,737ක් වැය කර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 45 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | | |
| (ආ) | බස්නාහිර, මධ්‍යම හා උතුරුමැද පළාත්වල නව සම්ප්‍රේෂණ මාර්ග හා නව ජාල උපපොලවල් ඉදිකිරීම මගින් සම්ප්‍රේෂණ ජාල සංවර්ධනය කිරීම හා සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය 2015 ජනවාරි මස ආරම්භ කර 2018 ජනවාරි මස නිමකිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දින වන විටත්, වැඩ අවසන්වී නොතිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා වැයකර ඇති මුදල රු.මිලියන 32,375 ක් වී තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 57ක් පමණ වී තිබුණි. | අසාමාන්‍ය ලෙස රුපියල අව ප්‍රමාණයවීම, අනපේක්ෂිත දේශීය උද්ධමනය සහ රටේ සාර්ව ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ පැකේජය 01 -2022.12.15 දින හා පැකේජය 02 - 2022.11.12 දින සිට ව්‍යාපෘති කටයුතු අත්හිටුවා ඇත.<br><br>පැකේජය 03 -2023.02.16 දින හා පැකේජය 04 - 2022.10.15 දින කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තු අතරමග නවතා දැමීමෙන් නැවත මිළ ගණන් කැඳවීමට සිදු වී ඇත. | - එම- |
| (ඇ) | 2021 කාර්යය සාධන වාර්තාවට අනුව මෙ.වො. 120ක් ජාතික විදුලි බල පද්ධතියට ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 530 ක් වූ අතර 2010 වර්ෂයේ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර 2022 ජුනි 30 වන විට විදුලි ජනනය කිරීම අපේක්ෂා කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර 2022 කෙටුම්පත් කාර්යය සාධන වාර්තාවට අනුව සියයට 99 ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන තිබුණද 2023 අගෝස්තු 31 දින වන විටත් ජාතික විදුලිබල පද්ධතියට එකතු කර නොතිබුණි. | මේ වන විට අවසන් අදියරයට පැමිණ ඇති උමාඔය ව්‍යාපෘතිය ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරිමට පෙර සිදුකල යුතු අවසන් අදියරේ පරීක්ෂණ හා නිරීක්ෂණ **(Testing and Commissioning)** කටයුතු කොටස් වශයෙන් සිදු කරමින් පවතී. | ව්‍යාපෘතියේ අවසන් අදියරේ කටයුතු කඩිනමින් ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) 2019 වර්ෂය තුල ආරම්භ කරන ලද හා 2022 වර්ෂය තුල අවසන් කල යුතු ඇස්තමේන්තු ගත පිරිවැය පිළිවෙලින් රු. මිලියන 6,787ක් හා රු. මිලියන 1,103ක් වූ කි.මී. 300 දිග විදුලි බෙදාහැරීමේ මාර්ග සහ ගැන්ට්‍රි ඉදිකිරීම හා පන්නිපිටිය ජාල උපපොලේ 100 MVRA BSC ස්ථාපනය කිරීම යන ව්‍යාපෘති 2023 අප්‍රේල් 30 වනවිටත් අවසන් කර නොතිබුණි. අදාල ව්‍යාපෘති වල 2022 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 44 සහ 78 ක් විය. | කි.මී. **300** දිග විදුලි බෙදාහැරීමේ මාර්ග සහ ගැන්ට්‍රි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සැලකිය යුතු ප්‍රමාදයක් සිදුවී ඇති නමුත් මේ වන විට ව්‍යාපෘතියේ කටයුතු සාර්ථකව කෙරෙමින් පවතී. පන්නිපිටිය ජාල උපපොළ **100 MVRA BSC** ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම මේ වන විට ගෙන ඇත. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විදුලිබල අංශයට අදාලව 2005 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වාහන අනතුරු 05 කට අදාලව රක්ෂණයෙන් ප්‍රතිපූරණය නොවූ තව දුරටත් අයකර ගතයුතු වටිනාකම රු.1,340,221 ක් වූ අලාභ හා බලශක්ති අංශයට අදාලව වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් අයකර ගැනීමට තිබූ රු.936,421 ක වූ අලාභ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2023 අගෝස්තු 31 දින දක්වා අය කර ගෙන නොතිබුණි. | අලාභ අය කර ගැනීමට කටයුතු සිදු කරමින් ඇත. | අලාභයන් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය සතුව ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති වීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු.මිලියන 63.55 ක් වැය කරමින් පුද්ගලික අංශයේ ගොඩනැගිල්ලක කාර්යාල කටයුතු පවත්වා ගෙන ගොස් තිබුණි. | ගොඩනැගිල්ලක් නොමැති බැවින් දීර්ඝ කාලයක සිට පුද්ගලික අංශයේ ගොඩනැගිලි, කාර්යාල කටයුතු පවත්වා ගෙන යාමට කටයුතු යොදාගෙන ඇත. නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අමාත්‍යාංශය පවත්වා ගෙන යාමට අවශ්‍ය ඉඩකඩ සහිත ස්ථානයක් ලබාගැනීමට උත්සාහ කලත් එවැනි පහසුකමක් ලබා දීමට නොහැකි බව දැන්වීම මත | රජයේ වියදම් පාලනය කිරීම සඳහා හැකි සෑමවිටම කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත පුද්ගලික අංශය සතු මෙම පරිශ්‍රය ලබා ගෙන ඇති බව දන්වා සිටිමි. | |
| (ආ) | 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ලද මහජන නියෝජනයක් පරික්ෂා කිරීමේදී අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරෙහි වැඩබැලීම සඳහා 2008 ජනවාරි 05 දින සිට 2015 ජුනි දක්වා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතු ඉංජිනේරුවරයෙකු 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය ප්‍රකාරව කැබිනට් අනුමැතිය ලබා ගැනීමකින් තොරව විදුලිබල මණ්ඩලය විසින් නිදහස් කර තිබූ අතර අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නොවූ, නියමිත වැටුප් පරිමාවක්ද නොතිබූ උක්ත තනතුර සඳහා විදුලිබල මණ්ඩලයේ නිත්‍ය තනතුරේ වැටුපෙන් සියයට 25ක් ගෙවීමේ අවිධිමත් පදනම මත සේවයේ යොදවා රු.2,047,347ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කර තිබුණි. උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2023 අප්‍රේල් 18 දිනැති විගණන විමසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අවිධිමත් ලෙස ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර අදාල නිලධාරියා 2023 අප්‍රේල් 27 දින විශ්‍රාම ගොස් තිබුණි. | එවකට විදුලිබල අමාත්‍යාංශයේ පැවැති අවශ්‍යතා මත මෙම පත් කිරීම සිදුකර ඇති අතර , ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් කරන ලද නියමයක් මත තම නිත්‍ය තනතුරේ වැටුපෙන් ¼ ක දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවා ඇත. | **i.** රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු අතර ගෙවීම් සිදු කිරීමේදී වගකිවයුතු නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව සැමඅතින්ම නිවැරදි වූ ගෙවීම් සිදුකළ යුතුය.<br><br>**ii.** අවිධිමත් ගෙවීම් නැවත අයකරගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2019 අගෝස්තු ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග (සංශෝධිත) ප්‍රකාරව, එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් හා ක්‍රියාකාරී කණ්ඩායමක් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2019 නොවැම්බර් මස පත්කර තිබුණද අදාල කමිටු උක්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා ක්‍රියාකාරී ලෙස කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය මෙන්ම ආර්ථිකමය හා දේශපාලන අර්බුද හේතුවෙන් රාජ්‍ය කටයුතු ඉතා අවම මට්ටමින් පවත්වාගෙන යාමට සිදු වූ අතර මේ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටු වූ කමිටුව මෙම කාර්යයන් ඉදිරියට ගෙනයාමේ ක්‍රමවේදයන් කමිටු වාර 3 කදී සාකච්ඡා කරන ලදි. | ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම සඳහා කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන දීර්ඝකාලය අවම කිරීමට කටයුතු කරන බව ප්‍රතිපත්තියේ දක්වා තිබුණද අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් පියවර ගෙන තිබූ බවට විගණනයට තහවුරු නොවීය. | 2021 වර්ෂයේදී සුනිත්‍ය බලශක්ති ධාරිතාව ඉහළ නැංවීම සඳහා සම්බන්ධීකරණ කේන්ද්‍රයක් පිහිටුවා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කැමති සංවර්ධකයන් වෙතින් අභිප්‍රායණ ලිපි (EOI) කැඳවමින් කටයුතු කර ඒ මත ඉදිරි ව්‍යාපෘති පෙළගැසීමක් කර ඇත. | -එම- |
| (ඉ) | ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග ප්‍රකාශයේ ඇතුලත් කාර්යසාධන කාලරාමුව මඟින් ඉලක්ක සහ අපේක්ෂිත ප්‍රතිපත්ති අභිප්‍රායන් සමඟ සම්බන්ධ විය හැකි කාලරාමු හා ප්‍රතිපත්ති අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීමේ වගකීම එක් එක් ආයතන වෙත පවරා තිබුණි . ඒ අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම,ජාතික ආර්ථිකය සඳහා ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සැපයුම් සේවා ලබාදීම , පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම, බලශක්ති අංශයේ යහපාලනය ශක්තිමත් කිරිම හා අනාගත බලශක්ති යටිතල ව්‍යුහය සඳහා ඉඩම් සුරක්ෂිත කිරිම සඳහා අපේක්ෂිත ඉලක්ක හා සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුව තිබුණද අදාල වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුවී නොතිබුණි. | කාලයත් සමග සිදුවූ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා වෙනස්විම් සහ අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරවූ විවිධ ගැටලුකාරී මෙන්ම නිශේධනාත්මක සාධක හේතුවෙන් උක්ත ඉලක්ක සංශෝධනය කිරීමට සිදු වුවද 2030 වන විට 70% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රබවයන්ගෙන් උපයා ගැනීමට හා කාබන් උදාසීන කිරීමේ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සකසා ඇත. ඉදිරි කාලය තුල මෙම කටයුතු නිසි පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ප්‍රතිපත්තියේ ඇතුලත් ඉලක්ක හා සංධිස්ථාන නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග ප්‍රකාශය අනුව බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිශ්චිතාවයන් පිළිබඳ සොයාබැලීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ප්‍රමාණවත් නියෝජනයක් සමඟින් " බලශක්ති ක්ෂේත්‍ර අවධානම් ඇගයීමේ මණ්ඩලය" ලෙස නම් කරන උසස් මට්ටමේ ස්ථාවර කාරක සභාවක් 2019 වර්ෂය අවසන් වන විට පත්කල යුතු වුවද, එම මණ්ඩලය පිහිටුවා ඇති බවට හෝ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණනයට තහවුරු නොවීය. | මෙම බලශක්ති ක්ෂේත්‍ර අවධානම් ඇගයීමේ මණ්ඩලය පත්කිරීම ජාතික මෙහෙයුම් කමිටුවේ හා ක්‍රියාකාරි කණ්ඩායම් මග පෙන්වීම මත සිදුකල යුතු වුවත් අග්‍රාමාත්‍යතුමන්ගේ සහභාගිත්වයෙන් පත්කල කමිටුවේදී එම පොදු දේපල අවධානයට යොමුකර අදාල ඉදිරි යෝජනා ක්‍රියාවට නැංවීමට නියමිතය. | -එම- |

## 4 මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ විදුලි බල අංශයට අදාල අනුමත කාර්යමණ්ඩලය 104 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 86 ක් වූයෙන් පුරප්පාඩු 18 ක් නිරීක්ෂණය විය. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 7 ක් නිරීක්ෂණය වූ අතර එයින් අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂක (සැලසුම්), අභ්‍යන්තර විගණක හා නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂක යන තනතුරු 2020 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර අතිරේක ලේකම් , ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) යන තනතුරු 2021 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ (සැලසුම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | විදුලි බල අංශයේ තෘතීය මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 4 ක් වූ අතර එම මට්ටමේ තනතුරු සියල්ල එනම් පරිපාලන නිලධාරී, භාෂා පරිවර්තක තනතුරු 2 ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී තනතුරක් 2020 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතිණි. | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නිසි පරිදි කාර්ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදුව ඊට අනුමැතිය ලැබී ඇත්තේ 2023.03.31 දිනය. | -එම- |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ බලශක්ති අංශය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අනුමත කාර්ය මණ්ඩලය 93 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 76 ක් වූයෙන් පුරප්පාඩු 17 ක් නිරීක්ෂණය විය. ඒ තුල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ප්‍රධාන ඉංජිනේරු, නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) , ගණකාධිකාරී හා නීති නිලධාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6ක් නිරීක්ෂණය විය. | මෙම තනතුරු පිරවීමට අවශ්‍ය කටුයුතු සලසා දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි මගින් ඉල්ලීම් කර ඇති අතර මේ දක්වා අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් අමාත්‍යාංශය වෙත ලබා දී නොමැත. | -එම- |

## 4.2 වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍ය කාර්යය මණ්ඩලයෙහි හා අමාත්‍යාංශයෙහි අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් 29 දෙනෙකු සේවයට යොදවා ගෙන තිබූ අතර 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මෙහෙයුම් අත්පොතෙහි 3.5 ඡේදය අනුව මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක1/2021 නිකුත් කරන විටත් ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා අනුමැතිය මත දීර්ඝ කාලයක පටන් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සේවකයින් නිදහස් කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා අමාත්‍යාංශයේ ඉල්ලීමක් යොමුකර නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |